(ඇ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙන් ජනිත වන රු.2,172,190,285,821 ක හිඟයත්, අයවැය ක්‍රියාකාරීත්වය සහ ඌනතාවය මූල්‍යනය කිරීමේ ප්‍රකාශයේ මුළු ආදායමෙන් වර්තන වියදම් අඩු කිරීමෙන් පසු ජනිත වන රු.1,650,857,019,989 ක හිඟයත් එකිනෙකට වෙනස් වුවද, ආදායම් ඌනතාවය ලෙස එම ඌනතාවයන් දෙකම එකම නමකින් නම් කර ඉදිරිපත් කර තිබුණි.

(ඉ) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි ඇතුළත් වත්කම් හා වගකීම්, ජංගම හා ජංගම නොවන ලෙස වර්ගීකරණය කර නොතිබුණි. මේ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන්ට හා ඒ පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ඉදිරි වර්ෂය තුළදී රජය විසින් ගෙවා නිම කළ යුතු බාහිර වගකීම් ප්‍රමාණය පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබාගත නොහැකි විය.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළ මූල්‍ය නොවන වත්කම් විකිණීමෙන් ලද රු.515,895,718 ක වටිනාකම ඒවායේ පිරිවැය සමඟ ගලපා, එහිදී පැන නඟින ලාභය හෝ අලාභය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ගැලපිය යුතු වුවත්, ගිණුම්කරණ මූලධර්මයන්ට පටහැනිව ඉහත දක්වා ඇති මුළු වටිනාකම වෙනත් ආදායමක් ලෙස හඳුනාගෙන තිබුණි.

(උ) රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඉඩම්, නොනිමි වැඩ හැර එකතුව රු. මිලියන 882,576 ක් වටිනා මූල්‍ය නොවන වත්කම් වෙනුවෙන් එම වත්කම්වල ක්ෂය කළ හැකි අගය එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා ක්‍රමානුකූලව වෙන් කරමින් විචක්ෂණ ගිණුම්කරණ සංකල්පයට අනුව ක්ෂය ප්‍රතිපාදනය සිදු කර නොතිබුණි. තවද මෙම වත්කම්වල අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු තරමින් සෑම මුදල් වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කළ යුතු වුවත්, එසේ සිදු කර නොතිබුණි. ඒ අනුව මෙම වත්කම්වල සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ වෙතොත් එය අඩු කිරීමෙන් පසු ලැබෙන ධාරණ අගය (Carrying amount) පිළිබඳව රජයේ මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන්ට නිශ්චිත අවබෝධයක් ලබාගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණි.

(ඌ) 2022 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම්වල මුළු වටිනාකම රු.2,093,287,997,716 වුවද, සමාලෝචිත වර්ෂයට අදාළව 2023 ජනවාරි 01 දිනට මෙම ශේෂය රු.2,017,866,940,344 ක් වී තිබුණි. ඒ අනුව, මූල්‍ය නොවන වත්කම්වල පෙර වර්ෂයේ අවසාන ශේෂයන් හා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් අතර රු.75,421,057,372 ක වෙනසක් නිරීක්ෂණය විය.

(එ) රජයේ මූල්‍ය ප්‍රකාශනවල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ භෞතික වත්කම් මිලදී ගැනීම හෝ ඉදිකිරීම් සහ වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම යටතේ රු.385,393,946,314 වටිනාකමක් දක්වා තිබුණ ද, මූල්‍ය ප්‍රකාශන අනුව අදාළ වත්කම් ඉහළ ගොස් තිබුණේ රු. 377,486,249,808 කින් පමණි. ඒ අනුව, රු. 7,907,696,506ක වෙනසක් නිරීක්ෂණය විය.